**නැවත පදිංචි කරවීමේ අධිකාරිය - 2014**

නැවත පදිංචි කරවීමේ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ අංක 20(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1800) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචි කරවීමේ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 පරිදි සමාලෝචිත වර්ෂය තුල මුදල් ගලායාම් හා මුදල් ගලාඒම් පිළිබිඹුවන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කළයුතු නමුත් ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(i). මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වී තිබුණු ශුද්ධ මුදල් ගලායාම රු.494,482 ක් වුවත් එය රු.258,067 ක් ලෙස දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහයන් ජනිත වී නොතිබුණි. නමුත් ආයෝජන කටයුතු වලින් ජනිත වූ මුදල් ගලා ඒම රු.530,524 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව සමාලෝචිත වර්ෂයේදී ක්ෂය ගණනය කිරීම සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය වෙනස් කිරීම මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

**2.3 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | **නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත | |
| (i) | 1 කොටසේ 12 වගන්තිය | උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා එම ප්‍රදේශවල ශාඛා කාර්යාල පිහිටුවීමට 2015 ජුනි 30 දින තෙක් අධිකාරිය කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 111 කොටසේ 20 (1) වගන්තිය | අධිකාරියට ස්වාධීන අරමුදලක් තිබිය යුතු වුවත් එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.513,936 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 170,208 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.684,144 ක පිරිහීමක් දක්නට ලැබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

නැවත පදිංචි කරවීමේ අධිකාරිය 2007 අංක 09 දරන පනත අනුව මූලික අරමුණු 02 ක් සහ කාර්යයන් 14 ක් දක්වා ඇති නමුත් එම අරමුණුවලට ලඟාවිය හැකි ආකාරයේ යෝජනා සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ සභාපතිවරයා අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබානොගෙන අධිකාරියේ කටයුතුවලින් පරිබාහිර විදේශ සංචාරයක් වෙනුවෙන් රු.46,651 ක මුදලක් අධිකාරියෙන් ලබාගෙන තිබුණි.

(ආ) අධිකාරියේ සේවක මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.30,912 ක ගෙවීම් සිදුකර පුවත්පත් දැන්වීම් පළකර තිබුණු නමුත් ඒ සඳහා නිලධාරීන් බඳවාගෙන නොතිබුණි.

(ඇ) අධිකාරියේ අරමුණු සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කර ගැනීම සඳහා රට අභ්‍යන්තරයේ අවතැන්වූ තැනැත්තන්ගේ සහ සරණාගතයන්ගේ තොරතුරු ලබාගෙන ඒ අනුව කාර්යයන් ඉටුකිරීම කළ යුතු වුවද, එම දත්ත ලබාගැනීමට අවශ්‍ය සැළසුම් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරියේ කාර්ය මණ්ඩලයට ඇතුළත්වූ ඉංජිනේරුවරයකු, තාක්ෂණික නිලධාරියකු සහ සැලසුම් ශිල්පවරයකුගේ තනතුරු 2007 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතිණි. ඊට අමතරව වර්ෂ 03 ක කාලයක් තුළ සංවර්ධන සහකාර තනතුරු 04 ක පුරප්පාඩු පැවතිණි. මෙම පුරප්පාඩු සඳහා පසුගිය වර්ෂය තුළදී නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර තිබුණු නමුත් 2015 මැයි 31 දින දක්වාම අදාල බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියේ අරමුණු සහ කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2014-2016 වර්ෂයන් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

අධිකාරිය විසින් දිස්ත්‍රික්ක 05 ක් සඳහා එක් දිස්ත්‍රික්කයකට ක්‍රියාකාරකම් 07 බැගින් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණි. කෙසේ වුවද, එක් දිස්ත්‍රික්කයක කිසිදු ක්‍රියාකාරකමක් සිදුවී නොතිබුණු අතර දිස්ත්‍රික්ක 03 ක පමණක් ක්‍රියාකාරකම් 03 ක් සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මෙන් සකස් කරන ලද ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ගැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි.

**5.3 අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම්**

2003 ජූනි 02 දිනැති පීඊඩී - 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමේදී එම රැස්වීම් සඳහා මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳව කාර්ය සාධන වාර්තාවක්, මාසික මෙහෙයුම් වාර්තාවන්, මාසික මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සේවක මණ්ඩල තත්ත්වය දැක්වෙන වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තාවන් ඉදිරිපත් කර සමාලෝචනය කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

අධිකාරියේ 2013 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු 2015 ජූනි 15 දින දක්වාම සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණයවූ අඩුපාඩු පිළිබඳව අධිකාරියේ සභාපතිවරයා වෙත වරින් වර වාර්තා කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) සේවක මණ්ඩල කළමනාකරණය
(ආ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම